සුභාෂිතයෙන්...

සත් ගුන යුත් සතන් හට නැඩ කලොත් සරු
අත් පිට දියුන්ව ම පල දේය නිරතුරු
වත් කල දිය නෙරලු තුරු මුලට පියකරු
දෙත් මුදුනින් දරමින් රැගෙන අමයුරු

පද පිලිවෙල ගැඳි පැදියෙන්:
සත් ගුන යුත්
සතන් හට
සරු වැඩ කලොත්
අත්පිට දියුනුවම
නිරතුරු පලදේය.

1. පියකරු
නෙරලු තුරු මුලට
වත් කල දිය
මුදුනින් දරමින්
රැගෙන දෙත්
අමයුරු (ය)

2. පියකරු
නෙරලු තුරු මුලට
දිය වත් කල
මුදුනින් රැගෙන දරමින්
අමයුරු ව දෙත්.

තේරුම:
යහපත් ගුන ඇති මිනිසුන්ට උපකාරයක් කලහොත් / කල විට ඒකාන්තයෙන්ම - ඒ වෙලේ ම (බලාගෙන සිටිදදීම) ඒ උදව්ව දෙගුනයක් වී පල දේ.

1. ලස්සන පොල් ගසක මුලට (ගස්වල මුලට) වත් කරන ලද වතුර (ඒ ගස / ගස්) මුදුනින් උසුලා (ආපසු) දෙන විට අමෘතය වැතිය. 2. ලස්සන පොල් ගසක / ගස්වල මුලට වතුර වත් කල විට (ඒ ගස ඒ වතුර) මුදුනට ගෙන දරමින් අමෘතය මෙන් (ආපසු) දෙත්.

විස්තරය: කියන්නා කියන දේ අසන්නට තේරුම් යෑමත, ලියන්නා ලියන දේ කියවන්නාට තේරුම් යෑමත් බාසාවක තිබිය යුතු ප්‍රදාන ගුනාංගයයි. එසේ නොවූ විට ඒ කියමනෙන් වත්, ඒ ලියමනෙන් වත් කිසි වැඩක් නැත. මේ ගැන ගැඹුරින් ම සිතා බැලීම යුතුය. සෙල් ලිපියක් තේරුම් ගැනීමට විදුදරුවන් කොතරම් වෙහෙසෙත් දැයි ඔබ සිතුවේද? මිසරයේ -හයරොග්ලිෆික්" ඉන්දියාවේ අශෝකාක්ශර කියවූ හැටි ඔබ දනිතැයි සිතමි.
අකුරු පද වැකි ගලපා ලියන්නේ තමන් සඳහා නොවේ. අනුන් සඳහාම ය. එහෙයින් විශේශයෙන් කවි - ගී - සින්දු - ගැඳි පැදි ලියන විට ඒ ප්‍රබන්දය වැකිවලට ගැලපිය හැකි දැයි සිතා බැලීම යුතුම ය. ඇතැම් විට ලියා ඇති දේ තේරුම් ගත නොහැකි වීමත්, වෙනත් විදියකට තේරුම් ගැනීමත් සිදු වේ.

1. මිනිහා කිඹුපා මරයි
කිඹුලා මිනිසා මරයි. එක්ම වචන තුන දෙවිදියකට අපි තේරුම් ගනිමු.

2. මිනිසෙක් කිඹුලකු මරයි.
කිඹුලකු මරයි, මිනිසෙක්.
මිනිසෙක් මරයි, කිඹුලකු.
මරයි මිනිසෙක්, කිඹුලකු
මරයි කිඹුලකු, මිනිසෙක්. මේ එක්ම වැකියේ පද තුන කොතන තිබුනත් වියරන නියර දන්නා කෙනාට එය තේරුම් ගත හැකිය.

1.වැකි දෙක එසේ පද මාරු කොට තේරුම් ගත නොහැක. -කිඹුලා මරයි, මිනිසා" යන වැකිය දෙවිදියකට තේරුම් ගත හැකිය.

දෙඩන කතා කරන විට අප බාවිතා කරන්නේ ගැඳි බසයි. "ජෝකරයකු" නොහොත් පිස්සකු පැදි බසින් ගියකින් හෝ සින්දුවකින් කතා කරන විට අපට - ජොලියක්" ඇති වේ. ලියන්න කෙටියෙන් පැවසීම, තම උගත්කම - දස්කම පෙන්වීම, වැනි හේතු නිසා කෙනකු පැදියෙන් තම අදහස පල කරතැයි සිතමි.

දනන් කියතත්
සඳේ ඇඳ ඇති
සා රුවක් ගැහ
එය මුසාවකි
සොඳුරියේ මට
පෙනෙනුයේ එහි
ඔබේ වතමය

පිරුනු හසරැලි. මගේ හිතට නැඟුනු මේ අදහස එක්තරා ප්‍රබන්දයකි.

එය ම , "සඳේ ඇඳ ඇති සාරුවක් ගැහ දනන් කියතත් එය මුසාවකිල සොඳුරියේ මට එහි පෙනෙනුයේ හස රැලි පිරුනු ඔබේ වත ම ය." යනුවෙන් හෝ "සඳේ ඇඳ ඇති සාවකු ගේ රූපයක් ගැහ මිනිසුන් කියන්නේ බොරුය,

සොඳුරියේ මට නම් එහි පෙනෙන්නේ සිනාවෙන් පිරුනු (සිනාසෙන) ඔබේ මුහුන ම ය. " යනුවෙන් ලියූ ගැඳි කඩ කිසිදු අගයක් නැති වැදගැම්මකට නැති එකක් විය හැකිය. කිසි කෙනකුගේ ඇස් එයට යොමු නොවිය හැකිය.

1.පද පිලිවෙල උගතුන් විසින් සෝදූ (සුදු (සුද්ද) කොට ගලපන ලද විදියයි; දෙත" යන අක්‍යාතය දෙස බලා එසේ සුදු කරන ලදැයි සිතමි. එලිවැට රැකීම සඳහා "දෙත" "දෙත්" කල හැකි කෙනාට "දෙයි" "දෙත්" කිරීමටද බාදා නැත.

"අමෘතය" මා දැක නැත; රස බලා ද නැත. එය දුටු කෙනකු හෝ රස බැලූ කෙනකු දැකලාත් නැත. එහෙයින් එය මී කිරි මෙන් උකුද දිය කිරි මෙන් දියර (දියාරු) ද, ටොපියක් මෙන් ගනද යන්න මම නොදනිමි.

අමෘතයේ රස නොදනිතත් රා, වයින්, බීර අමෘතය වගේ යැයි කියන්නෝ සිටිති. අමෘතය වැනි -පැනක්" (බීමක්) ලබාගැනීම සඳහා පොල් ගස / ගස් මුලට වතුර වත් කරන්නේ " අංගොඩ" යැවීමට සුදුස්සෙකි. " ගජකුම් බිඳින එකසර කෙසරිඳු., තන කබල නුබුදිති" (කෙසරහු යනුවෙන් වෙනස් කරන ලද පොතුත් ඇත යන කවිය ලියූ මේ කතු වරයා "දේ" වෙනුවට "දෙත්" ලියා එලි වැට රැක ඇතැයි සිතීම වැරදිද?

වි.ක. ධර්මබන්ධු

ලක්හඬ ට තවත් සම්මානයක්

විවිධ භාෂා 65 කින් පමණ පුවාරය වන ජනවාර්ගික ගුවන් විදුලි වැඩසටහන් අතරින් 2010 වසරේ හොඳම කාන්තා වැඩසටහන ලෙසට ඕස්ට්‍රේලියා වේ මෙල්බන් නුවර ලක්හඬ ගුවන් විදුලියේ කාන්තා වැඩසටහන වන කාන්තා හඬ, කැන්බරා නුවර පැවැති ජාතික ජනවාර්ගික සහ බහුසංස්කෘතික කවුන්සලයේ 25 වෙනි වාර්ෂික සමුලුවේදී සම්මාන ලැබීය.

කාන්තා හඬ ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි සහ රූපවාහිනී මාධ්‍යවේදිනියක් ලෙස කටයුතු කළ තේජා කටුගම්පොල මහත්මියගේ සමීප දායකත්වයෙන් ආරම්භ වූ අතර එය දැනට සමීපා දනය කර ඉදිරිපත් කරන්නේ ලංඩනයේ BBC ආයතනයේ සංදේශය වැඩසටහනේ මාධ්‍යවේදිනියක් ලෙස සේවය කළ අනුෂා නානායක්කර මහත්මියයි. ජාතික ජනවාර්ගික සහ බහුසංස්කෘතික කවුන්සලයේ ප්‍රතිපත්ති සම්පාදක සහ විධායක නිලධාරී රසල් ඇන්ඩර්සන් මහතා ගෙන් ලක්හඬ ගුවන් විදුලියේ සභාපති ගාමිනී ගොන්සේකා මහතා එම සම්මානය ලබා ගත් අවස්ථාව ඡායා රූපයෙන් දැක්වේ.

මීගමුවෙන් නවාතැනක්

නිවාඩුවකට ලංකාවට යන ඔබට/පවුලේ අයට සුවපහසු නවාතැනක් මීගමුවෙන්.
කටුනායක ගුවන් තොටුපොලට කිමී 6

සතියකට අයකිරීම ඩොලර් 130 යි

විස්තර විමසන්න
0425 866 257
email sherine36@gmail.com

Do You Want To Migrate To Australia?

For All Your Australian Migration Visa Requirements

- General Skilled Migration (onshore & offshore)
- Employer Nominations
- State Government Sponsorship
- Business Migration
- Family Visitor
- Spouse / De facto
- Graduate Skilled Visa Subclass 485/885 & 886
- Student Visa Extension
- MRT and RRT Appeals
- Skills Assessment

MIA
MEMBER OF MIGRATION INSTITUTE - OF AUSTRALIA -
MRAN 0958576

We provide professional and cost effective service to our clients.
Step by step assistance and guidance until the end.

Ananda Kumarasiri
Australian Migration Consultant
Dip. Marketing
Grd. Cert. Imm. Law -VU
MIB (Inr.Trade) –DU

Contact Details:
No 1 Heathcote Court,Endeavour Hills,Vic 3802,Australia.
Tele/Fax +61 3 9708 1168 Mobile +61 4 2585 1577

No 88, Diyawanna Garden,Battaramulla,Sri Lanaka.
Tele/Fax +94 112 787 645 Mobile +94 773 249 923
anandakumarasiri1@gmail.com

Professional dedication to make your dreams become a reality.

MASS Design - Sri Lanka. www.messadvertising.net / www.mcss.lk / admass@sltnet.lk